## සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

**1. ශ්‍රේණිය** :-11 ශ්‍රේණිය **විෂය** :- නාට්‍ය හා රංග කලා **අදාළ සතිය** :- ජනවාරි මාසය 2 වන සතිය

**2.පාඩම/ ඒකකය**:-. සෙසු ප්‍රාසාංගික කලා අතුරෙන් නාට්‍ය කලාවෙහි සුවිශේෂ ලක්ෂණ හඳුනාගැනීම.

**3. ශිෂ්‍යයා කළ යුතු කාර්යය**

නාට්‍ය කලාව යන්න හඳුන්වන්න.
නාට්‍යයක් යනු යම්කිසි සිදුවීමක් හෝ අවස්ථාවක් සතර අභිනය භාවිතා කරමින් ප්‍රේක්ෂකයා ඉදිරියේ කර පෙන්වන සජීවී ජීවමාන කලාවකි.

නාට්‍ය කලාව පිළිබඳ විවිධ විචාරක මත

- ★ ලෝක ස්වභාවය අනුකරණය කර ප්‍රතිනිර්මාණය කොට පෙන්වීම නාට්‍යයි.

 ........................................................................................................

- ★ ක්‍රියාවක් අනුකරණය කර පෙන්වීම නාට්‍යයයි

........................................................................................................

- ★ නාට්‍ය යනු ජීවිතයේ පෙත්තකි.

........................................................................................................ නාට්‍ය කලාව අනෙකුත් කලාවන් අතරින් සුවිශේෂී වන්නේ කෙසේද?

1. ........................................................................................
2. ........................................................................................
3. ........................................................................................
4. ........................................................................................
5. ........................................................................................

නාට්‍ය කලාවට පමණක් සුවිශේෂී වූ ලක්‍ෂණ පමණක් තෝරා පහත සඳහන් වගුවේ √ ලකුණ යොදන්න.

- ★ ගබඩා කර තැබිය හැක ( )
- ★ සජීවිය ( )
- ★ කලින් පටිගත කර ඉදිරිපත් කරයි. ( )
- ★ සංස්කරණය කල නොහැක ( )
- ★ එක් වේලාවකදී කිහිප ස්ථානයකම ප්‍රදර්ශනය කල හැක. ( )
- ★ අවකාශ භාවිතය සීමා සහිතයි ( )
- ★ දර්ශන තල අසීමිතව භාවිත කල හැක. ( )

නාට්‍ය කලාවට පෝෂණය කරනු ලබන සෙසු කලාවන් මොනවාදැයි සඳහන් කරන්න.

........................................................................................
........................................................................................
........................................................................................

. .

**අනෙකුත් ප්‍රාසාංගික කලා අතුරෙන් නාට්‍ය කලාවේ සුවිශේෂත්වය,**

- සජීවී කලා මාධ්‍යකි.

- නාට්‍ය සඳහා සතර අභිනයම යොදා ගනී
- අනෙක් ප්‍රාසාංගික කලාවන්ට වඩා වැඩියෙන් සාත්වික අභිනය හා වාචික අභිනය වාචිකාභිනය නාට්‍යයේ දී යොදා ගැනේ .
- කතා වස්තුවට ප්‍රබල ස්ථානයක් හිමි වේ .
- ආකෘතිය ශෛලිය හා තේමාව අනුව නාට්‍ය ප්‍රභේද වෙනස් වේ.
- නාට්‍ය පෙළක් භාවිතා කරන අතර පෙළෙහි ඇතුළත් රංග විධාන වල රංගනය සඳහා අවශ්‍ය උපදෙස් අඩංගු වේ.එසේම සංවාද හා රංග විධාන නාට්‍යයේ ක්‍රියාකාරීත්වය තීරණය කරයි.
- නිශ්චිත ස්ථානයක නිශ්චිත කාල සීමාවක් තුළ නැරඹිය යුතු වේ.
- ප්‍රේක්ෂක ප්‍රතිචාර මට්ට නාට්‍යයක වෙනස් වීම් වෙනස්වීම් පවා සිදුකළ හැකිවේ .
- ප්‍රේක්ෂකයා රසිකයකු මෙන්ම විචාරකයකු ද වේ.
- නාට්‍යයක් යනු සාමූහික පිරිසකගේ සහභාගිත්වය සහ විවිධ කලා මාධ්‍යයන් ගේ මනා වූ සුසංයෝගයකි .

**නාට්‍යයේ සාමූහික ක්‍රියාවලියට සම්බන්ධ වෙන පිරිස,**

- පෙළ රචකයා
- අර්ථපති (නිෂ්පාදක /මුදල් යොදවන්න)
- පෙළ මතක් කරන්නා
- අධ්‍යක්ෂක (පුහුණු කර ඉදිරිපත් කරයි)
- වේශභූෂණ සැලසුම්කරු
- ශබ්ද හා රංගාලෝක ශිල්පීන්
- අංග රචනා ශිල්පීන්
- වේදිකා පරිපාලක
- නාට්‍ය සංවිධායක
- පෙළ මතක් කරන්නා
- රංග භාණ්ඩ සැලසුම්කරු
- සංගීත අධ්‍යක්ෂ හා සංගීත වාදන ශිල්පීන්
- නළු නිළියන්
- ඉගෙනුම් ආධාරක:-

  e - නැණ පියස:- 11 ශ්‍රේණිය

  11 ශ්‍රේණිය රංග කලා අතිරේක කියවීම් පොත

  You tube නාලිකා :-

  https://www.youtube.com/watch?v=QQG4uHoI_zs&t=56s

  https://www.youtube.com/watch?v=ueNn7FyUcJw&t=102s

**5.අපේක්ෂිත ඉගෙනුම් ඵල:-**

- නාට්‍යයක අන්තර්ගත කලාංග පිළිබඳ ව විමසයි.
- විවිධ කලා මාධ්‍යයන්ගේ භාවිතය පිළිබඳ අවශ්‍යතාව තේරුම් ගනියි.
- විවිධ කලාවන් අතර නාට්‍යයට හිමි තැන අවබෝධ කරගනියි.
- සජීවී ප්‍රේක්ෂක ප්‍රතිචාර මත ක්ෂණික ව වෙනස්වීම් කළ හැකි බව වටහාගනියි.